**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**අ.පො.ස. (උ/පෙළ) විභාගය - 2020 (නව/පැරණි නිර්දේශ)**
**ප්‍රතිඵල නැවත සමීක්ෂණ අයදුම්පත්‍රය**
**මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්**
**(පාසල් හා පෞද්ගලික අයදුම්කරුවන් සඳහා)**

**ප්‍රතිඵල නැවත සමීක්ෂණයේ දී අදාළ පිළිතුරු පත්‍ර සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් කිහිප දෙනෙකු යටතේ සම්පූර්ණයෙන් ම පරීක්ෂාවට ලක් කරනු ලැබේ. නැවත සමීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස Z ලකුණෙහි හෝ ලැබී ඇති ශ්‍රේණියේ වැඩිවීමක් හෝ අඩුවීමක් හෝ සිදුවිය හැකි බව අපේක්ෂකයින් විසින් දැනගත යුතු බව අවධාරණය කරමි.**

01. **උක්ත විභාගයේ නැවත සමීක්ෂණ අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමයට පමණක් කැඳවනු ලැබේ.**

02. **අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනය 2021.07.10 වේ.**

03. නැවත සමීක්ෂණය සඳහා අයදුම් කිරීමට පහත දැක්වෙන ක්‍රමයක් අනුගමනය කරන්න.
    - විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (https://doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති මාර්ග ගත අයදුම්පත් "පාසල් විභාග" මත Click කිරීම මගින්
    - විභාග දෙපාර්තමේන්තුවේ නිල ජංගම දුරකථන යෙදවුම (Mobile Application) වන DoE වෙත පිවිස මාර්ගත අයදුම්පත් (පාසල් විභාග) මත Click කිරීම මගින්
    - https://onlineexams.gov.lk/eic වෙත පිවිසීම මගින්

04. අයදුම්පත් සම්පූර්ණ කිරීමට ප්‍රථම Technical Instructions, Common Instructions සහ උපදෙස් වීඩියෝව නැරඹීම, නිවැරදි ආකාරයට අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා අත්‍යාවශ්‍ය වේ.
**(පද්ධතියට පිවිසීමේදී ඔබ විභාගයට පෙනී සිටි ජාතික හැඳුනුම්පත් අංකයම භාවිතා කිරීමට සැලකිලිමත් විය යුතුය.)**

05. එක් විෂයයක් සඳහා නැවත සමීක්ෂණය කිරීමේ ගාස්තුව රු. 250/= කි. Credit කාඩ්/ Debit කාඩ් මගින් හෝ තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදුකළ හැකිය.

06. මුදල් ගෙවීමෙන් පසු අයදුම්පත්‍රය PDF ක්‍රමයට බාගත (Download) කර ගත හැකි අතර, එම අයදුම්පත්‍රය ඔබ භාරයේ තබා ගත යුතුය. එසේම මුදල් ගෙවීමෙන් පසු ඔබගේ ජංගම දුරකථන අංකයට SMS පණිවිඩයක් ද ලැබෙනු ඇත.

07. ඔබට නැවත සමීක්ෂණය සිදු කිරීමට අවශ්‍ය සියලුම විෂයයන් සහිතව නිවැරදිව අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම අයදුම්කරුගේ වගකීම වේ. අදාළ ගාස්තුව ගෙවා නොමැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත්‍ර සඳහා ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

08. විෂය අංක 12 - සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා ලකුණු 30 කට වඩා අඩුවීම හේතුවෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලැබූ අයදුම්කරුවන්ට එම විෂයය සඳහා ද නැවත සමීක්ෂණ අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

**සැ.යු - දිවයිනේ පවතින වර්තමාන කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙවර පාසල් අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර සඳහා විදුහල්පතිගේ නිර්දේශය/ අත්සන අවශ්‍ය නොවන බව කරුණාවෙන් සලකන්න.**

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

පාසල් විභාග ඇගයීම් ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.
2021.06.23